# <u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව</u>

## <u>ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL3) යටතේ</u>
## <u>රියදුරු තනතුරු වලට බඳවා ගැනීම</u>

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනට පුරප්පාඩුව පවතින **රියදුරු** තනතුරු සඳහා සුදුසුසන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ඇබෑර්තු සංඛ්‍යාව - **02 යි.**

02. රියදුරු තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මේ සඳහා අයදුම්කරන්නේ නම් අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සහිතව සකස් කරන ලද අයදුම්පතක් **2019.04.18** දිනට පෙර **අධ්‍යක්ෂ (පාලන හා ආයතන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 04** වන **මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** යොමු කරන ලෙස දන්වමි. (අයදුම්පත් එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"රියදුරු තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුයි).

03.

(අ) <u>**අධ්‍යාපන සුදුසුකම්:-**</u>

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම.

(ආ) <u>**වෘත්තීය සුදුසුකම් :-**</u>

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බල පත්‍රයක් ලබා තිබීම.

(ඇ) <u>**පලපුරුද්ද :-**</u>

රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

(ඈ) <u>**කායික සුදුසුකම් :-**</u>

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(ඉ) **වෙනත් සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු වියයුතුයි.
II. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුයි.

04. **වයස :-**

අවම වයස් සීමාව අවු:18-45 අතර විය යුතුයි (රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරණ අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

05. **තනතුරු වල ස්වභාවය :-**

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

06. **වැටුප් පරිමාණය:-** 25,790-270×10-300×10-330×10-350×12-38,990

වැටුප් කේත අංකය - PL-03-2016 A

අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
04 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.